විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2010 දිනය / திகதி / Date 2010. 07. 16

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/2010

දිසා ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්,
ත්‍රිවිධ හමුදාපතිවරුන්,

**<u>සන්නද්ධ සේවා නිලධාරින් හා සෙසු නිළයන් සඳහා</u>**
**<u>පූර්ණ විශ්‍රාම වැටුප් ලබා දීම</u>**

පහත සඳහන් නිර්නායක වලට අනුකූලව සන්නද්ධ සේවා නිලධාරින් හා සෙසු නිලයන් සඳහා පූර්ණ විශ්‍රාම වැටුප ලබා දීමට රජය තීරණය කර තිබේ .

1. **ත්‍රස්තවාදී යුද්ධය නිමකල 2009. 05. 19 දිනට සේවයේ යෙදී සිටි සන්නද්ධ සේවා නිලධාරින් හා සෙසු නිළයන්**

   I. වසර 22ක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරින් හා සෙසු නිලයන් එදින හෝ ඊට පසු විශ්‍රාම ලබන්නේ නම් 85% ක අඩු නොකල ප්‍රතිශතය මත විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය ගණන් බැලිය යුතුය .ඒ අනුව මාසික විශ්‍රාම වැටුප අඩු නොකල ප්‍රතිශතය 85% ද අඩු කල ප්‍රතිශතය 75% ක්ද වේ.

   II. සන්නද්ධ සේවා නිලධාරින් /නිලධාරිනියන් හා සෙසු කාන්තා නිලයන් අනිවාර්යය සේවා කාලය සපුරා ඇත්තේ නම් දැනට හිමි විශ්‍රාම වැටුප් ප්‍රතිශතයට 15% අතිරේක ප්‍රතිශතයක් එකතු කොට 85% උපරිමයකට යටත්ව විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය හා මාසික විශ්‍රාම වැටුප ගණනය කල යුතුය.

   III. 2009. 05. 19 දිනෙන් පසු විශ්‍රාම ලබා පැරණි ප්‍රතිශතය අනුව විශ්‍රාම වැටුප් ගණනය කර ඇත්තේ නම් නව ප්‍රතිශතය අනුව සංශෝධිත අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතුය.

   IV. 2009. 05. 19 දිනට පසු සේවයට බැදුනු /බැදෙන සන්නද්ධ සේවා නිලධාරින් හා සෙසු නිලයන් සඳහා මෙම ප්‍රතිශතයන් අදාළ නොවේ . ඔවුනට මෙතෙක් ක්‍රියාත්මක වූ විශ්‍රාම වැටුප් විධිවිධාන එලෙසම අදාළ වේ.



| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

2. 2009. 05. 19 දිනට පෙර විශ්‍රාම ගොස් සිටින සන්නද්ධ සේවා නිලධාරින් හා සෙසු නිලයන්

I. 2009. 05. 19 දිනට පෙර විශ්‍රාම ලැබූ වසර 22 ක සේවා කාලයක් සපුරා ඇති සහ අවම වශයෙන් වසර 05 ක කාලයක් ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටි සන්නද්ධ හමුදා නිලධාරින් හා සෙසු නිලයන් සඳහා 85% ක මාසික විශ්‍රාම වැටුප් සංශෝධනයට හිමිකම ලැබේ.

II. සන්නද්ධ සේවා නිලධාරින්/ නිලධාරිනියන් හා සෙසු කාන්තා නිලයන් අනිවාර්ය සේවා කාලය සපුරා ඇත්තේ නම් හා වසර 05 ක ක්‍රියාන්විත රාජකාරියේ සිටියේ නම් දැනට හිමි විශ්‍රාම වැටුප් ප්‍රතිශතයට 15 % ක අතිරේක ප්‍රතිශතයක් එකතු කොට (85% උපරිමයට යටත්ව ) මාසික විශ්‍රාම වැටුප් සංශෝධනයට හිමිකම ලැබේ.

III. නව ප්‍රතිශතය මත සකස් කල සංශෝධිත ප්‍රදාන පත්‍රය ඒ ඒ හමුදා විශ්‍රාම වැටුප් අංශ විසින් ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත යැවීමට ක්‍රියා කල යුතුය. එසේ යැවීමේදී අවම වශයෙන් වසර 05 ක කාලයක් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි බව විශ්‍රාම වැටුප් අංශ ප්‍රධානින් සහතික කොට තිබිය යුතුය.

3. සේවා අකාර්යක්ෂමතාවය මත හෝ විනය හේතු මත විශ්‍රාම ගන්වා ඇති/ ගන්වනු ලබන සන්නද්ධ හමුදා නිලධාරින් / නිලධාරිනියන් හා සෙසු නිලයන් සම්බන්ධයෙන් ඉහත විධිවිධාන අදාළ නොවිය යුතුය.

4. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහාභාණ්ඩාගාරයේ එකගතාවය මතය. සමාංක විවැ/චක්‍රලේඛ/2010 හා 2010. 06. 29 දිනැති චක්‍රලේඛය අවලංගු කෙරෙන අතර මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුරටත් අර්ථකතනයන් හෝ පැහැදිලි කිරීම් අවශ්‍ය වෙතොත් පහත සඳහන් අංශ විමසා ක්‍රියාකල යුතුය.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ - ( හමුදා අංශය ) - 011- 2320439
- නියෝජ්‍ය අධ්‍යක්ෂ - ( ප්‍රතිපත්ති අංශය ) - 011- 2329580

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂජනරාල්

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. ලේකම් - රාජ්‍ය ආරක්ෂක , මහජන ආරක්ෂාව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
4. ලේකම්- මුදල් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
5. ලේකම්- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
6. සන්නද්ධ හමුදා විශ්‍රාමික සංගම්
7. විගණකාධිපති.